# ජාතික රාජ්‍ය සභාවේ

# 1978 අංක 14 දරන පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 මැයි මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 30 යි — තැපැල් ගාස්තුව : ශත 15

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 14 දරන
පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 11/78.

පුපුරණ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 14 දරන පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුපුරණ ද්‍රව්‍ය පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 183 වන අධිකාරයේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා සහ නියෝජ්‍ය පාලකවරයෝ.

2. (1) මේ පනතේ කාර්යයන් සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයා පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා විය යුතු ය.

(2) මේ පනතේ කාර්යයන් සඳහා අමාත්‍යාංශයේ සෑම සහකාර ලේකම්වරයෙක් ම නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකවරයෙක් විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරයන් සහ වෙනත් කාර්ය මණ්ඩලය.

3. (1) සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරයන් වශයෙන් හෝ එලෙස ක්‍රියා කිරීම පිණිස හෝ, නමින් හෝ නිලයෙන් හෝ, මේ පනතේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් ද මේ පනතේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ කාර්යයන් සඳහා පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරයන් විය යුතු අතර ඔවුන් සැරයන්වරයකුගේ තරාතිරමට පහළ නොවන්නා වූ පොලිස් නිලධරයන් විය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ඉවත් කිරීම.

ධාන ඥප්තියේ වන ගන්තිය ‍ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නියෝජ්‍ය පාලකවරයන්, සහකාර පාලකවරයන් පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරයන් සහ බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයන් පාලකවරයාගේ විධානයට යටත් විය යුතු බව.

5. (1) සෑම නියෝජ්‍ය පාලකවරයකු ම, සෑම සහකාර පාලකවරයකු ම සහ සෑම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරයකු ම ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්යයන් ඉටු කිරීමේ දී පාලකවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

(2) සෑම බලපත්‍ර නිකුත් කරන බලධරයකු ම ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය ඉටු කිරීමේ දී පාලකවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය. ".

ධාන ඥප්තියේ II වන කොටසේ ශීර්ෂ පාඨය ‍ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට පෙරාතුව ම වූ III වන කොටසේ දැක්වෙන ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ :—

" පාලකවරයාගේ බලතල සහ වැරදි සහ දණ්ඩන. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන සහ 26 වන වගන්ති සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන සහ 26 වන වගන්තිවල " පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරයකු " යන වචන එම වගන්තිවල යෙදෙන කවර අවස්ථාවක වුව ද ඒ වචන වෙනුවට " පාලකවරයා " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

8. 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

" පාලකවරයාගේ බලතල.

26අ. මේ පනත යටතේ පාලකවරයාගේ බලතල නියෝජ්‍ය පාලකවරයකු, සහකාර පාලකවරයකු, පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරයකු හෝ ස්වකීය දිස්ත්‍රික්කය ඇතුළත යම් බලපත්‍ර නිකුත් කරන බලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" පාලකවරයා, නියෝජ්‍ය පාලකවරයන්, සහකාර පාලකවරයන් සහ බලපත්‍ර නිකුත් කරන බලධරයන් පොලිස් නිලධරයන් ලෙස සලකනු ලබන බව.

31. පාලකවරයා, සෑම නියෝජ්‍ය පාලකවරයකු ම, සෑම සහකාර පාලකවරයකු ම සහ සෑම බලපත්‍ර නිකුත් කරන බලධරයකු ම යන මේ එක් එක් තැනැත්තා, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතින් පොලිස් නිලධරයකු වෙත පැවරුණු යම් බලයක් මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, එම යුක්තිය පසිඳලීමේ පනතේ අර්ථානුකූලව පොලිස් නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ "පාලකවරයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "නියෝජ්‍ය පාලකවරයකු" යන්නෙන් නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකවරයකු අදහස් වේ.'.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.